INTRODUCING 1st TIME IN UK

FareDeals Travel & Tours
Fly With Someone You Trust
FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane,
(Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

Fly to Colombo

Srilankan Air	£ 400
Qatar Air	£ 295
Kuwait Air	£ 250
Oman Air	£ 175
Ethihad Air	£ 350

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Fly to London / UK

Srilankan	Rs. 85000*
Qatar	Rs. 62000*
Kuwait	Rs. 56000*
Royal Jor	Rs. 58000*

Student Offers (o/way)

Srilankan	Rs. 42000
Qatar	Rs. 58000*
Kuwait	Rs. 41200*

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.
Emergency Travel ctc Dulip
0208 150 9183 07551549559
Call us 0800 612 4045 info@faredealtravels.co.uk

ETIHAD Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS

මාලිනී ආසියාවේ හොඳම 25 දෙනා අතරට

ශ්‍රීලංකාවේ අසහාය සිනමා නිළි රැජිණ මාලිනී පොන්සේකා මහත්මිය ආසියාවේ මෙතෙක් බිහිවූ හොඳම සිනමා ශිල්පීන් **25** දෙනා අතරට තෝරා ඇත. පසුගිය සතියේ අසියා පැසිපික් සිනමා ආයතනය මගින් **ආකාස කුසුම්** නම් නවතම සිංහළ චිත්‍රපටයේ මාලිනී රඟපෑ **සන්ධ්‍යා රාණි** නම් චරිතය වෙනුවෙන් හොඳම නිළිය ලෙස නම් කරනු ලැබීය.

ආසියා පැසිපික් සම්මාන උළෙල යුනෙස්කෝ ආයතනය, ජාත්‍යන්තර සිනමා නිශ්පාදක සංසදය හා සීඑන් එන් (CNN) ප්‍රවෘත්ති සමාගම එකමිතියෙන් වාර්ෂිකව පැවැත්වේ. නොවැම්බර් 26 දා ඕස්ට්‍රේලියාවේ තිබෙන මෙම උළෙලට රටවල් 43 කින් සිනමා කෘති 210 ඉදිරිපත්ව තිබේ.

1968 දී **පුංචි බබා** චිත්‍රපටයෙන් තිරයට පිවිසි මාලිනී, සිංහළ සිනමාවේ ප්‍රතිභාපූර්ණ නිළිය වශයෙන් දෙස් විදෙස් කීර්තියට පත්වෙමින් ජාත්‍යන්තර සම්මානද දිනා ඇත.

1972 දී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ **නිධානය** චිත්‍රපටය සිංහළ සිනමා ඉතිහාසයට නවතාවක් එක්කළ අනුස්මරණීය නිර්මාණයක් බවට පත්විය. එහි ගාමිණී පොන්සේකා සමග මාලිනී නිරූපණය කළ විශිෂ්ට භූමිකාව අදත් අප සිත්හි නොමැකී පවතී.

හොඳම 25 දෙනා අතර ඉන්දියාවේ අමිතාභ බච්චන් සහ නාර්ගීස් ද සිටිති.

මාලිනී පොන්සේකා මහත්මිය ශ්‍රී ලංකාවේ ළඟදී එන මහ මැතිවරණයෙන් දේශපාලනයට ද පිවිස සිටී.

♦ **වෙනුර**

හමුදා උත්සාහයෙන් විල්පත්තුව යළි පිබිදේ!

කොටි ත්‍රස්ත-වාදීන් විසින් බිම් බෝම්බ වළලා කිසිවෙකුට පය තබන්නට නොහැකි අන්දමින් අණතුරට පත්කර තිබූ විල්පත්තු ජාතික වනෝද්යානය යුද හමුදාවේ ඉන්ජිනේරු අංශයේ බෝම්බ නිෂ්ක්‍රීය නිලධාරීන්ගේ දැඩි, එමෙන් ම මහත් අවදානම් සහිත උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් යළිත් යථා තත්වයට ගෙනෙමින් දැන් එම වනෝද්‍යානය නරඹන්නට පහසු තත්වයකට පත්කර තිබේ.

2006 මැයි මස කොටි ත්‍රස්තවාදීන් විසින් විල්පත්තු භූමියේ වළලනු ලැබ තිබූ ක්ලේමෝ බෝම්බයකට හසුවීමෙන් වන උයන නරඹන්නට ගිය හත් දෙනෙකු ඇතුළත් පිරිසකගේ ජීප්රථය පුපුරායාමෙන් ඒ සියල්ලෝ මරුමුවට පත්වූහ. කොටි ත්‍රස්තවාදීන් විල්පත්තුවට ඇතුල්වී එහි බෝම්බ වළලා ඇති අයුරු දැනගත්තේ එහි දී ය. එදා සිට විල්පත්තුවට කිසිවෙකු ගියේ නැත. අනුරාධ පුරයට පහරදුන් කොටි ඒ ප්‍රහාරයෙන් පසු සැඟවී සිටියේ විල්පත්තු වනාන්තරයේය. හමුදාවට පැමිණිය නොහැකි සේ බෝම්බ වළලා උන් එම වනය තම ආරක්ෂක ස්ථානයක් බවට පත්කරගෙන සිටියෝය.

ශ්‍රීලංකා සන්නද්ධ හමුදා කොටි ත්‍රස්තවාදීන් මුළුමනින් වනසා රට මුදාගැනීම සාර්ථකව අවසන් වෙනවාත් සමගම නව හමුදාපති ජෙනරාල් ජගත් ජයසූරිය හමුදා ඉන්ජිනේරු අංශය යොදවා විල්පත්තු වනෝද්‍යානය ශුද්ධකිරීම ආරම්භ කළේය. ඒ සියල්ල සාර්ථකව නිමවෙමින් දැන් එම සුප්‍රකට අභයභූමිය ජනතාවට ද, විදේශීය සංචාරකයන්ට ද ආරක්ෂාසහගත තැනක්ව ඇත.

♦ ***කේ. එල්. කරුණාරත්න*** **Sri Lanka**

♥ පැටියො ඩාලිං

" පැටියො අම්මට කියලා යැව්වා මට පොලොස් කන්න ආසෙයි කියලා..... අන්න අම්ම ඒවත් හදාගෙන ලන්ඩන් එනවලු.... "

" මළ කෙළියයි....! "

" ඇයි මළ කෙළියයි කියන්නෙ...? ඔයා අපේ අම්ම එනවට ආස නැද්ද? "

" නෑ... නෑ... ආස නැතුව නෙවෙයි.... මට නිකං එහෙම කියවුණා...අනේ සොරි ඇ.... "

Sinhala Lesson 07 සිංහළ පාඩම

සිංහල ඉගෙනීමට පහසු මගක් !

These Sinhala lessons are especially designed for the Sinhala expatriate children to learn Sinhala correctly, and also for the foreigners those who are keen to learn this beautiful language.

The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.

Vowel Strokes

ා ැ ෑ ි ී ු ූ ෘ ෙ ේ ො ෝ ෞ

ඩ dug ඩා dark ඩැ dab

ඩෑ dash ඩි did ඩී deep

ඩු doing ඩූ do ඩෙ den ඩේ day

ඩො dot ඩෝ don't ඩ් bud

♦ ආචාර්ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

හරස්පද ප්‍රහේලිකා 117



හරහට :

1 බොහෝ 3 සූර්‍යයා
5 සංදේශ කාව්‍යයකි
7 ගොයම් පාගන තැන
9 වහල උසුලාගෙන සිටී
10 බොරු 11 ගොරෝසු

පහළට :

1 නරක කාලයට ලැබේ
2 වෙනස් නොවන
4 මිණුම් ප්‍රමාණයකි
6 මෙවැනි සිහියක් ඇති අයට පිස්සන් යයි කියති
8 ලග්නයකි 9 අදහස් ප්‍රකාශකරන්නට මෙය අවශ්‍යය

ගියවර නිවැරදි විසඳුම්

හරහට : 1 සරු 3 පස 5 කවිය 7 ලතව 8 හදිසි 10 මහන්සි
පහළට : 1 සකල 2 රුචිත 4 සන්නාසි 6 යවහන් 9 දිසි

නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

අල ව්‍යංජනයක්
Potato Curry with Spring Onions

අවශ්‍ය ද්‍රව්‍ය :

අල	රාත්තල්	1
ලූනු	ග්‍රෑම්	100
මාලු මිරිස්	ග්‍රෑම්	75
තක්කාලි	ග්‍රෑම්	100
මිංචි	ග්‍රෑම්	50
එළවළු තෙල්	කෝප්ප	½
පොල්කිරි මිටිකිරි	කෝප්ප	1
විනාකිරි	කෝප්ප	¼
ලුණු අවශ්‍ය පමණ		
කුරුඳු කුඩු	තේ හැඳි	½
ගම්මිරිස්	තේ හැඳි	1 යි
සෝයා සෝස්	තේ හැඳි	3 යි
රම්පෙ කරපිංචා		

සාදන ක්‍රමය :

අල සෝදා, ලුණු දමා තම්බා, පොතුහැර, දිග අතට කපා, ගැඹුරු තෙලේ බැදගන්න. බොම්බයි ලූනු රවුම් හැඩයටත්, මාලු මිරිස් දිග අතටත්, තක්කාලි කොටු හැඩයටත් කපාගන්න. භාජනයක් ලිප තබා තෙල් ටිකක් දමා රත්කර එයට රම්පෙ, සේරා, කරපිංචා දමා බදින්න, කුරුඳු හා ගම්මිරිස් කුඩුත් එකතුකරන්න. ඊළඟට සෝයා සෝස්, විනාකිරි, ලුණු එකතුකර, ඊට කපාගත් එළවළු එක්කර, දැන් එයට බැදගත් අල දමා මිශ්‍රකර, ඊළඟට කිරි එක්කර විනාඩි තුනක් පිසගන්න. ලිපෙන් පා පාස්ලි කොළ උඩින් ඉහින්න.

ප්‍රවීන සූපවේදිනී

♦ ***මොනිකා ලක්ෂම් ලොරෙන්සුහේවා*** **Sri Lanka**

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සෑම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432